**2015 පාර්ලිමේන්තු මැතිවරණය ඓතිහාසික වැදගත්කමක් සමඟින් ඉතිහාසයට එක්වී අවසන්ය. වැඩිම ආසන සංඛ්‍යාවක් හිමිකරගත් එක්සත් ජාතික පෙරමුණේ නායක රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍ය ධුරයේ දිවුරුම් දුන්නේය. ඒ සමඟම ජයග්‍රාහී එජාපෙත් දෙවෙනියට වැඩිම ආසන සංඛ්‍යාවක් හිමිකරගත් සන්ධානයත් එක්ව සම්මුතිවාදී ජාතික ආණ්ඩුවක් වෙනුවෙන් අවබෝධතා ගිවිසුමක්ද අස්සන් කළේය. මෙවර පාර්ලිමේන්තු මැතිවරණයෙන් ප්‍රකට කෙරෙන දේශපාලන ප්‍රවණතාවන්, අලුත් ආණ්ඩුවට මුහුණ දීමට සිදුවනු ඇති අනාගත අභියෝග සහ ඒවාට මුහුණ දිය යුතු ආකාරය සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අංශයේ අංශාධිපති ආචාර්ය ටෙරන්ස් පුරසිංහ සමඟ කළ සාකච්ඡාවකි මේ.**

# මැතිවරණ ප්‍රතිඵලයෙන් පෙනෙන්නේ ජනතාවගේ දේශපාලන නොදියුණු බවයි

## ආචාර්ය ටෙරන්ස් පුරසිංහ

**අංශාධිපති-දේශපාලන විද්‍යා අධ්‍යනාංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**



**මැතිවරණයේදී සීමිත වැඩි ආසන සංඛ්‍යාවක් හිමි කරගනිමින් එක්සත් ජාතික පෙරමුණ ආණ්ඩුවක් පිහිටුවීමට සමත් වුවත් මැතිවරණයේ සැබෑ ජයග්‍රාහකයා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිතිවරයා සහ ඔහුගේ පිල බවට මතයක් පලවෙනවා. ඒ ගැන ඔබේ විග්‍රහය කුමක්ද?**

සාමාන්‍යයෙන් ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ මැතිවරණයකදී එක වැඩි ඡන්දයකින් දිනුවත් එය ජයක් ලෙසයි සළකන්නේ. පරාජයත් එහෙමයි. ඡන්ද පරතරය ඉතාම අඩුවෙන් ජයග්‍රහණය කළත් ඒ ජයග්‍රහණය ගැන කිසිම විවේචනයක් කරන්න බැහැ. ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ මූලික පිළිගැනීම එයයි. ඒ නිසා ජයග්‍රහණය කළ පක්ෂයට ආසන්නම ඡන්ද සංඛ්‍යාවක් අරගෙන කරට කර තරඟයක් දුන්න අපියි ජයග්‍රහණය කළේ කියන එක ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රමයකට අදාළ කරගත හැකි තර්කයක් නෙවෙයි. 2005 ජනාධිපතිවරණයේදී රනිල් වික්‍රමසිංහ පරාජය කරමින් මහින්ද රාජපක්ෂ ජයග්‍රහණය කළේ වැඩි ඡන්ද පනස්දාහක පමණ ප්‍රමාණයකින්. ඒ වෙලාවේ රනිල් වික්‍රමසිංහ කිව්වේ නෑ මම මේ ඡන්ද පනස් දාහක් වගේ සුළු ප්‍රමාණයකින්නේ පැරදුනේ කියලා. පසුගිය ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂට වඩා මෛත්‍රීපාල සිරිසේන ලක්ෂ හතරක චන්ද ගත්තා. ඒක පැහැදිලි ජයග්‍රහණයක්.

**නමුත් මහින්ද රාජපක්ෂ පිල පරාජය කරන්න පෙළ ගැසුණු බොහෝ පිරිසක් බලාපොරොත්තු නොවුණ තරම් විශාල බලයක් මැතිවරණයේදී මහින්ද පිලට ලැබිලා තිබෙනවා. එය පැහැදිලි කරගන්නේ කොහොමද?**

විශේෂයෙන්ම යුද ජයග්‍රහණයෙන් පසුව මහින්ද රාජපක්ෂ කියන්නේ රට බේරාගත්ත නායකයා කියන මතයක් ජනතාව තුළ ඇතිකරනු ලැබුවා. මේකට දේශපාලන විද්‍යාවේ කියන්නේ වශීකරණාත්මක නායකත්වය කියලා. විශේෂයෙන්ම සිංහල ගැමි ජනතාව තුළ මහින්ද රාජපක්ෂ වශීකරණාත්මක නායකයෙක් බවට පත්වුණා. පත් කෙරුණා. ඒ නිසා ඔහුගේ ඡන්ද පදනමේ විශාල අඩුවීමක් මේ මැතිවරණයේදී වුණේ නැහැ. නමුත් සැළකිය යුතු අඩුවීමක් වුණා. ජනාධිපතිවරණයේදී ඔහු පරාජයට පත්වුණේ ඡන්ද ලක්ෂ හතරකින්. මේ මැතිවරණයේදී ඔහු ප්‍රමුඛ බලවේගයට ඡන්ද ලක්ෂ 11කින් පමණ පරාජයට පත්වුණා.
අනෙක මේ සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ආණ්ඩු පක්ෂය සහ විරුද්ධ පක්ෂය කියලා ගත්තොත් ඒ දෙක අතර ආසන වල පරතරය පුළුල් වෙන්නේ නැහැ. ඒ නිසා මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ සන්ධානයට ආසන 95ක් ලැබුණා. කාට හරි පෙනෙන්න පුලුවන් ආසන 95යි 106යි අතර ලොකු වෙනසක් නැහැ කියලා. ඒ නිසා මේ බලවේග දෙකටම දේශපාලන භූමිකාව තුළ යම් කිසි ආකාරයකින් බලයේ හවුල්කාරීත්වය දැරීමේ යුක්ති සහගත අයිතියක් තියනවා කියන ආකරයේ මතයක් දැන් සමාජගත කෙරෙනවා. මේක ප්‍රජාතන්ත්‍රවාදයට තියන භයානක අනතුරක්. මේ ජයග්‍රහණය පිළිගන්න මහින්ද රාජපක්ෂ සහ ඒ බලවේගය සූදානම් නැහැ. ඔවුන්ගේ ආකල්පයක් තිබෙනවා මේ රට අයිති මහින්ද රාජපක්ෂට කියලා. ශ්‍රී ලංකාව කියන්නේ මහින්ද රාජපක්ෂ කියලයි පහුගිය කාලේම ඔවුන් සිතුවේ. ඒ නිසාම මහින්ද රාජපක්ෂට විරුද්ධ වීම කියන්නේ රටට විරුද්ධවීමක් රාජ්‍ය ද්‍රෝහී ක්‍රියාවක් කියන ආකල්පයක් ඇතිවුණා. ඒ තුළ තමයි ඔය විදිහට ජනතාවට හිතෙන්නේ.

**අලුත් ආණ්ඩුවේ ඉදිරි පැවැත්ම මොනවගේ වේවිද?**

අද ආණ්ඩුව සහ විපක්ෂය අතර ආසන 11 ක වෙනසක් තිබෙනවා. 94 චන්ද්‍රිකා මැතිණිය මුස්ලිම් කොන්ග්‍රසයත් එක්ක එකතුවෙලා ආණ්ඩුව හදපු කාලේ එතුමියට පාර්ලිමේන්තුවේ ආසන තිබුණේ 113යි. විරුද්ධ පක්ෂයේ 112ක් හිටියා. එහෙම තිබිලත් ඒ ආණ්ඩුව වැටුණේ නැහැ. ඊට වැඩිය බලයක් අලුත් ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ තිබෙනවා. එහෙත් මහින්ද රාජපක්ෂ බලවේගය තවදුරටත් පෙනී සිටින්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ දේශපාලන වැඩපිළිවෙළට එරෙහිව. මේ මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයට බහුතරය ලැබුණු වෙලාවේ මහින්ද රාජක්ෂ පිලේ ජෝන් සෙනෙවිරත්න, ගාල්ලේ මනූෂ නානායක්කාර කියන මන්ත්‍රීවරුන් කිව්වේ අපි කෙටි කාලෙකින් නැවත ශක්තිමත් වී මේ ආණ්ඩුව පෙරළනවා කියලයි. මහින්ද රාපක්ෂ කිව්වෙත් අපි නැවත සංවිධානය වෙලා මේ ආණ්ඩුව පෙරළනවා කියලයි. මේ කියන්නේ කුමන්ත්‍රණයකින් ආණ්ඩුව පෙරළනවා කියලනේ. මහජන ඡන්දයෙන් ආණ්ඩුව පෙරළනවා නම් පෙරළන්න වෙන්නේ තව අවුරුදු පහකට පස්සේ. එයින් පෙනෙන්නෙත් මේ අය තවමත් පරාජය පිළිගන්න කැමති නැති බවයි. මහින්ද රාජපක්ෂ කියන්නේ අපරාජිත නායකයෙක් කියලා පහුගිය කාලේ හදපු මානසිකත්වයේ ප්‍රතිපලයයි ඒ.

**දූෂිතයන්ට, අපරාධකරුවන්ට, නූගතුන්ට ඡන්දය දෙන්න එපා කියන ඉල්ලීම මැතිවරණ ව්‍යාපාරයේදී දැඩිව ඉදිරිපත් වුණත් වැඩිම මනාප ලබාගෙන තියන වැඩි පිරිසක් එවැනි අය වීම පැහැදිලි කරගත යුත්තේ කොහොමද?**

රටේ බහුතරය දූෂිතයන්, නූගතුන් ප්‍රතික්ශේප කර තිබෙන බවයි ප්‍රතිපලයෙන් පෙනෙන්නේ. නමුත් තවදුරටත් රටේ සැළකිය යුතු පිරිසක් ඉන්නවා රාජාණ්ඩුවාදය පිළිගත්ත, යටහත් පහත්භාවය පිළිගත්ත. ඒ ජන කොටස තමයි මහින්ද පිලට ඡන්දය දීලා තිබෙන්නේ. ඒ අය හංවඩු ගැහුණු දූෂිතයන්ට ඡන්දය දෙන්නේ මහින්ද ශක්තිමත් කිරීමටයි. වැඩිම මනාප ගත්ත අය අතර පහුගිය කාලේ හිරගෙදර හිටිය අයත් සැලකිය යුතු සංඛ්‍යාවක් ඉන්නවානේ. දැනටත් හිරේ ඉන්න අයටත් වැඩිම මනාප ලැබිලා තියනවා. මේක ඡන්දදායකයාගේ නූගත්කමම නොවෙයි. පුරුද්ද. සමහර අය



**සාකච්ඡා කළේ-**
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

ඉන්නවා කොහොමටවත් අලියට කතිරේ ගහන්න බෑ කියන ආකල්පයෙන් එහෙම පුරුද්දක් ඇතිකර ගෙන.

අනෙක් අතට සමහර අයට මන්ත්‍රීවරයෙක් වුවමනා වෙන්නේ තමන්ගේ ප්‍රදේශයට වැඩක් කරගන්න. පුද්ගලික ඕනෑ එපාකම් ඉෂ්ට කරගන්න. එහෙමයි ඡන්දදායකයා බලන්නේ. එතන තියෙන්නේ උපයෝගීතාවාදය. එතනදි ඉස්මතුවෙන්නේ පුද්ගලයන්. ඒ වෙනුවෙන් දූෂිතයන්ට, මැරවරයන්ට වුවත් ඔවුන් ඡන්දය දෙනවා. දියුණු රටවල ඉස්මතු වෙලා තියෙන්නේ පුද්ගලයන් නොවෙයි. දේශපාලන පක්ෂ ක්‍රමයයි. එය ඉතාම බලවත්. ඒ වගේම පරිණතයි. මන්ත්‍රීවරුන් ඉන්නේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න ප්‍රායෝගිකව මැදිහත්වෙන්න නොවෙයි. ජනතා ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනයටයි. රැකියා ලබාගැනීම, මාර්ග ඉදිකරගැනීම, විදුලි බලය ලබාගැනීම වැනි සුබ ශාදන ඕනෑ එපාකම් ඉෂ්ට කරන්න දියුණු රටවල වෙනම ආයතන තිබෙනවා. රක්ෂා දෙන්න වෙනම ආයතනයක් තිබෙනවා. යාන්ත්‍රණ තිබෙනවා. පාරවල් හදන්න වෙන ආයතනයක් තිබෙනවා. ඒ වගේම දියුණු රටවල රටේ සෑම පුරවැසියෙකුටම සමාන අවස්ථා සහ සමාන පිළිගැනීමක් තිබෙනවා. එහෙම වුණාම කිසිවෙකුටත් රැකියා ඉල්ලගෙන, ළමයා ඉස්කෝලේ දාගන්න, සමෘද්ධිය හදාගන්න මන්ත්‍රීවරුන් පස්සේ යන්න වුවමනා වෙන්නේ නැහැ. එතකොට මන්ත්‍රීවරයාගේ කාර්ය වන්නේ ප්‍රතිපත්ති සම්පාදනයයි. නමුත් ලංකාවේ මන්ත්‍රීවරු නොකරන්නෙම ඒ කාරණයයි. මන්ත්‍රීවරු කරන්නේ රස්සා දෙන එක, මළ ගෙවල්වල යන එක, පුටු බෙදන එක, තහඩු බෙදන එක වගේ මන්ත්‍රීවරුන්ට අදාළ නොවෙන දේවල්. ඒ තරමට මෙය විකෘති වෙලා තියෙන්නේ.

**නමුත් ජනතාවගේ ප්‍රශ්න විසඳගන්න ආසනයකට නිශ්චිත මන්ත්‍රීවරයෙක් සිටිය යුතුයි කියන එක නේද රටේ පොදු පිළිගැනීම වෙලා තිබෙන්නේ? එයත් ඔබ ඉදිරිපත් කරන අදහසත් පරස්පරයි.**

ආසනයට මන්ත්‍රීවරයෙක් ඕනේ කියා ඉදිරිපත් වෙන අදහසම ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනියි. මොකටද ආසනයකට මන්ත්‍රීවරයෙක්? රස්සාවක් ගන්න, මාරුවීමක් ගන්න, ළමයා ඉස්කෝලෙට දාගන්න, ඒවාටද අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත්කරගන්නේ? ඒක නෙවෙයිනේ මන්ත්‍රීවරයාගේ කාර්යභාරය. අපේ රටේ වෙලා තියෙන්නේ සියලු දේ මන්ත්‍රීවරයාගෙන් බලාපොරොත්තු වීමයි. මන්ත්‍රීවරයා ප්‍රතිපත්ති සම්පාදකයෙක් නොකොට සමාජ සේවකයෙක් බවට පත්කරගන්නවා. මේකට දේශපාලන පක්ෂ සහ ඡන්දදායකයන් කියන දෙපාර්ශ්වයම වගකිව යුතුයි. ආසනයට මන්ත්‍රීවරයෙක් ඉන්න කොට දේශපාලන පක්ෂවලට තියන ආධිපත්‍ය තවත් වැඩිවෙනවා. පක්ෂයෙන් කාව දැම්මත් එයාට ඡන්දය දෙන්න ජනතාවට සිදුවෙනවා. මනාප ක්‍රමයේදී ජනතාවට අවස්ථාවක් ලැබෙනවා පක්ෂයෙන් දාන අය අතරින් කිසියම් තෝරාගැනීමක් කරන්න. මේක මනාප ක්‍රමයේ වරදක් නොවෙයි. පිහියක් අතේ තිබෙන කෙනෙකුට පුලුවන් ඒකෙන් ඇපල් ගෙඩියක් කපාගෙන කන්න. ඒ වගේම තවත් කෙනෙකුට පුලුවන් ළඟ ඉන්න කෙනෙකුගේ බෙල්ල කපන්න. ඒක පිහියේ වරදක් නෙවෙයිනේ. මනාප ක්‍රමයත් ඒ වගෙයි. වරද තියෙන්නේ මනාප ක්‍රමයේ නොවෙයි. අපි එය භාවිතා කරන ක්‍රමයේයි. මනාප ක්‍රමය කියන්නේ දියුණු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක එක් අංග ලක්ෂණයක්. මෙවළමක්. එවැනි මෙවලමක් භාවිත කරන්න තරම් දියුණු තත්ත්වයක මේ රටේ දේශපාලන පක්ෂ හෝ ඡන්දදායකයන් නැහැ. ලෝකයේ ආසන ක්‍රමය අසාර්ථකයි. සාර්ථක වෙලා තිබෙන්නේ සමානුපාතික ක්‍රමයයි. ඒ නිසා ආසනයට නිශ්චිත මන්ත්‍රීවරයෙක් ඉන්න ඕනේ කියන අදහසම පසුගාමී දේශපාලන අදහසක්.

**ජනතා විමුක්ති පෙරමුණට මැතිවරණයේදී අත්වූ ඉරණමත් ඉතාම විවාදාපන්නයි. ඒ ගැන ඔබේ විග්‍රහය කුමක්ද?**

ජනතා විමුක්ති පෙරමුණ ගැන නිර්වචනය කිරීම හරිම අපහසුයි. ජවිපෙ ස්වාභාවය අවිනිශ්චිතයි. එක් එක් කාල පරිච්ඡේදවලදී ජනතා විමුක්ති පෙරමුණේ ස්වාභාවය එකිනෙකට පරස්පර වෙනවා. මේ මැතිවරණයේදී සහ ජනාධිපතිවරණයේදී ජන සමාජය හරියටම පිල් දෙකකට බෙදෙනවා. එකක් තමයි ප්‍රජාතන්ත්‍රවාදය, ශීලාචාරකම ගරුකරන පිල. අනෙක අධිපතිවාදය, ම්ලේච්ඡත්වය, අශිලාචාරකම ගරුකරන පිල. මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ බලවේගය ජයගත්තා නම් රට ඉතාමත් ම්ලේච්ඡ තත්ත්වයකට පත්වෙනවා. මේ ඡන්ද දෙකේදිම තිබුණේ ජීවිතයත් මරණයත් අතර සටනක්. මේ විදිහට ජන සමාජයක් ප්‍රධාන පිල් දෙකකට බෙදෙන අවස්ථාවකදී තුන්වෙනි පක්ෂයකට තැනක් ලැබෙන්නේ නැහැ. එහෙම වෙලාවක ආණ්ඩු බලයක් ගන්න බැරි, ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය දෙන්න ජනතාව පෙළඹෙන්නේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ශීලාචාරකම ගරු කරන ජනතාවට මේ අවස්ථාවේදී අවශ්‍ය වුණේ මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ බලවේගය පරාජය කරන්නයි. එවැනි තීරණාත්මක අවස්ථාවක විපක්ෂයේ භූමිකාවට ඔවුන් තෝරාපත් කරන්න කියන තේමා පාඨය ජනතාව පිළිගත්තේ නැහැ. ඒ තේමා පාඨයම හාස්‍ය ජනකයි. මැතිවරණයකදී ඉතාම කුඩා පක්ෂයක් වුණත් ආණ්ඩු බලය ඉල්ලවා මිස විපක්ෂයේ බලය ඉල්ලන්නේ නැහැ. එවැනි සුළු දෙයක් වුවත් ජවිපෙට තේරෙන්නේ නැහැ. ජවිපෙ ඒතරම්ම බොළඳයි. විපක්ෂයේ බලය දෙන්න ඕනේ කියන අදහස දරන පිරිසක් ඉන්නවා නම් සුළු පිරිසකුයි ඒ තරම් දුරට හිතන අය ඉන්නේ. නමුත් පුළුල් බලවේගය පෙළ ගැසුණේ මහින්ද රාජපක්ෂ පරාජය කිරීමටයි. එහි ප්‍රතිපලය තමයි අපෙක්ෂා කළ මන්ත්‍රී ආසන සංඛ්‍යාව නොලැබීම.

**ගාල්ලෙන් ගීතා කුමාරසිංහගේ පැමිණීම සහ කොළඹින් සන්නස්ගල හැලීම වගේ කාරණා අපි තේරුම් කරගත යුත්තේ කොහොමද?**

ඡන්දදායකයාගේ හැසිරීම පිළිබඳ අපිට නිශ්චිත නිගමනවලට එන්න හැකියාවක් නැහැ. මේ දෙදෙනා අතරින් ගීතා කුමාරසිංහට සාපේක්ෂව බැලුවොත් සන්නස්ගල තේරී පත්විය යුතුයි කියලා මම හිතනවා. නමුත් පත්වෙන්නේ ගීතා කුමාරසිංහ. ඡන්දදායකයා එක තැනක එක විදිහකටත් තවත් තැනෙක තවත් විදිහකටත් හැසිරෙනවා. එක පැත්තකින් ගීතා කුමාරසිංහ දිනන කොට තවත පැත්තකින් රෝසි සේනානායකත් පරාජයට පත්වෙනවා. රෝසි සේනානායක නිළියක් වුණාට පහුගිය කාලේ සමාජ සේවිකාවක් විදහට ජනප්‍රියත්වයට පත්වෙච්ච කෙනෙක්. ගීතාට සාපේක්ෂව බුද්ධිමත් කෙනෙක්. ඒ වගේම පහුගිය මැතිවරණයේදී උපේක්ෂා ස්වර්ණමාලි කියන කිසිම